රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 10/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1988 මාර්තු මස 30 දි

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

අසනීප නිවාඩු -

<u>ආයතන සංග්‍රහය - XII පරිච්ඡේදය.</u>

කරුණාකර 6:1 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරන්න.

"6:1 නිලධාරියෙකු රෝගීවීම නිසා නිවාඩු ඉල්ලුම් කරන විට හෝ අසනීපයක් නිසා දින දෙකකට වැඩි කාලයක් තුළ කාර්යාලයට පැමිණිය නොහැකි වන විට හෝ එම නිලධාරියා, ළඟම සිටින රජයේ වෛද්‍ය නිලධාරියා ලවා තමා පරීක්ෂා කරවා ගත යුතුය. එවිට එම වෛද්‍ය නිලධාරියා වෛද්‍ය 170 හෝ ආයුර්වේද 44 දරන ආකෘති පත්‍රයෙහි ලියන ලද සහතිකයක් නිලධාරියා රාජකාරියෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවේ හෝ උප කාර්යාලයේ ප්‍රධානියා වෙත යැවිය යුතුය."

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.